අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

## ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Dancing(Oriental)

# නැටුම් (දේශීය)



**Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය : සෞන්දර්යය ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 44 | S | I |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

නැටුම් (දේශීය) I,II
நடனம் (சுNjச) I,II
Dancing (Oriental) I,II

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
[illegible] 10 - [illegible]
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

නැටුම් (දේශීය)

**I පත්‍රය - පිළිතුරු**

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1. | ……2…… | 11. | ……4…… | 21. | ……1…… | 31. | ……2…… |
| 2. | ……1…… | 12. | ……1…… | 22. | ……3…… | 32. | ……4…… |
| 3. | ……3…… | 13. | ……3…… | 23. | ……2…… | 33. | ……4…… |
| 4. | ……4…… | 14. | ……4…… | 24. | ……4…… | 34. | ……3…… |
| 5. | ……3…… | 15. | ……2…… | 25. | ……1…… | 35. | ……1…… |
| 6. | ……1…… | 16. | ……1…… | 26. | ……3…… | 36. | ……4…… |
| 7. | ……2…… | 17. | ……2…… | 27. | ……2…… | 37. | ……2…… |
| 8. | ……4…… | 18. | ……4…… | 28. | ……4…… | 38. | ……2…… |
| 9. | ……1…… | 19. | ……3…… | 29. | ……1…… | 39. | ……4…… |
| 10. | ……3…… | 20. | ……1…… | 30. | ……3…… | 40. | ……2…… |

**විශේෂ උපදෙස් :** එක් පිළිතුරකට ලකුණු 01 බැගින්

මුළු ලකුණු 1 x 40 = 40

**I I පත්‍රය - පිළිතුරු**

(1) ලකුණු

1. සීතාභරණ 1
2. කේරළ කලා මණ්ඩලම් 1
3. ප්‍රශස්ති 1
4. මහ 1
5. උපුල්වන් (විෂ්ණු ) 1
6. දෙපානෝ 1
7. සෝම බන්ධු විද්‍යාපති 1
8. මෝල්ගස් 1
9. අ .ලෙන්චිනා 1 } 2
   ආ .පුරන්සිනා 1
10. අ .අද්භූත රසය 1 } 2
    ආ.වීර රසය 1

**(i) සිට(viii) දක්වා පිළිතුරකට ලකුණු 1 බැගින්- ලකුණු 8**

**(ix) සිට(x) දක්වා පිළිතුරකට ලකුණු 2 බැගින්- ලකුණු 4**

**මුළු ලකුණු 8+4 = 12**

**(2)**

(i ) පහත දැක්වෙන බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

උඩරට නර්තන සම්ප්‍රදාය

**බෙර පදය - දො දොංත තකු දොං**

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| දො | දොං | - | ත | ත | කු | දොම් | - | දො | දොං | - | ත | ත | කු | දොම් | - |

පහතරට නර්තන සම්ප්‍රදාය

**බෙර පදය - රෙහුද ගතකු දොම්**

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| රෙ | හු | ද | ග | ත | කු | දොම් | - | රෙ | හු | ද | ග | ත | කු | දොම් | - |

සබරගමු නර්තන සම්ප්‍රදාය

**දවුල් පදය - ජිමිතකුදා දොම්**

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ජි | මි | ත | කු | දා | - | දොම් | - | ජි | මි | ත | කු | දා | - | දොම් | - |

විභාග දැක්වීම සහ සංකේත සදහා - ලකුණු 02
බෙර පදය/දවුල් පදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02
ලකුණු 04

**ii.** පහත දැක්වෙන කවි පදය මාත්‍රා තුනේ (3+3) තාල රූපයට ප්‍රස්තාර කරන්න.

කවි පදය - පුරවර මැද බැඳි රන් ඔංචිල්ලා

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | පුර | ව | ර | මැ | ද | බැ | ඳි | - | - | - | - |
| + | රන් | ඔං | - | චිල් | - | ලා | - | - | - | - | - |

විභාග දැක්වීම සහ සංකේත සදහා ලකුණු - 02
කවි පද ප්‍රස්තාර කිරීමට ලකුණු - 02
ලකුණු 04

**(iii).** මාත්‍රා 3+4 තාලයට අයත් අඩව්වක් හෝ මාත්‍රා 2+2+3 තාලයට අයත් ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ද | තත් | - | ජෙං | - |
| + | + | + | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| ජී | - | කු | ජික් | කුං | තරි | කිට | ජි | කු | ද | තත් | - | ජෙං | - |
| + | + | + | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| තා | - | කු | තත් | කුං | තරි | කිට | ත | කු | ද | තත් | - | ජෙං | - |
| ජී | - | කු | ජික් | කුං | තරි | කිට | ජි | කු | ද | තත් | - | ජෙං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ජී | - | කු | ජික් | කුං | තරි | කිට |
| ත | කු | ද | තත් | - | ජෙං | - | - | - | - | ජෙං | - | තා | - |
| ජෙ | තා | - | ජෙං | ත | කු | ද | ජෙං | - | ත | තා | - | - | - |

(ඉහත අඩව්ව වෙනුවට "<u>තත්ත තරි තරි.....</u> අඩව්වද යොදා ගත හැකිය).

පහතරට නර්තන සම්ප්‍රදායේ ශුද්ධ තාලය (සිංදු වන්නම ඉරට්ටිය)

^ ^ / ^ ^ /

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | - | ඟු | ද | ග | ත | - | දිත් | - | දිත් | - | තෙයි | - | - |
| ග | ත | ඟු | ද | ග | ත | - | දිත් | - | දිත් | - | තෙයි | - | - |
| තත් | - | ඟු | ද | ග | ත | - | ග | ත | ඟු | ද | ග | ත | - |
| ඟු | ද | ගත් | - | ඟු | ද | ගත | තත් | - | ඟු | ද | ග | ත | - |
| දිත් | - | දිත් | - | තෙයි | | | | | | | | | |

සබරගමු සම්ප්‍රදායේ මණ්ඩුක වන්නමෙහි අඩව්ව

^ / ^ /

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | ති | ත | ග | ත | දොං | - |
| ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | ග | ත | දෙං | - |
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ද | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ද | ග | ත |
| තා | | | | | | | | | | | | | |

විභාග දැක්වීම සහ සංකේත සදහා - ලකුණු 02
අඩව්ව /ඉරට්ටිය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02
ලකුණු 04

<u>මුළු ලකුණු (4X 3) =12</u>

**3. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

**i. ද්‍රවිඩ ගැමි නැටුම්**

- ද්‍රවිඩ සංස්කෘතිය හා සබැඳි ගැමි ජනතාවගේ නැටුම් විශේෂයකි.
- සරල චලන හා ද්‍රවිඩ ජනයාගේ සරළ රංග වස්ත්‍රාභරණ භාවිත කරයි.
- සෙම්බු, කෝලාට්ටම් ,පින්නල් කොල්ලාට්ටම්,සුලකු, කාවඩි,කුම්මි,කරගම් යන ඒවා ද්‍රවිඩ ගැමි නැටුම් වේ.
- මේවා සිංහල ගැමි නැටුමට සමාන බවක්ද දක්වයි.
- ද්‍රවිඩ ගැමි නැටුම් දෙවියන් උදෙසා, විනෝදය සඳහා, සමාජීය අවශ්‍යතා සඳහා නටනු ලබයි.
- තවිල් බෙරය , නාගස්වරම් යන වාද්‍ය භාණ්ඩ ගැමි නැටුම් සඳහා වාදනය කරනු ලබයි .

**ඉහත කරුණු වලින් හතරක්වත් ලියා තිබේ නම්**

**ලකුණු - 04**

**ii. ප්‍රස්තාරකරණය**

- නර්තන,ගායන,වාදනයේ දී ප්‍රායෝගිකව ඉදිරිපත් කරන පදයක්, කවියක් හෝ ගීතයක් ලියා දැක්වෙන ක්‍රමය ප්‍රස්තාරකරණය වේ.
- ප්‍රස්තාර කරණය සඳහා යොදාගනු ලබන මූල ධර්ම ලෙස සංඥා ,සංකේත, විභාග, යතිය,මාත්‍රා කැටීවීම, සමග්‍රහ, අවග්‍රහ යනාදිය භාවිත කරයි.
- ප්‍රස්තාර කිරීම මගින් යම්කිසි පදයක , කවියක් හෝ ගීතයක තාලය හඳුනාගත හැකි වෙයි.

**ඉහත කරුණු වලින් දෙකකවත් ලියා තිබේනම්**

**ලකුණු - 04**

**iii. කඩතුරා කවි**

- උඩරට,පහතරට හා සබරගමු සම්ප්‍රදායන් තුනටම පොදු ගායනා විශේෂයකි.
- බෞද්ධාගමික ස්වරූපයක් මෙම ගායනා වල අන්තර්ගත වේ.
- ශාන්ති කර්මවල දී රංග සැරසිල්ල ආවරණයට භාවිතා කරන තාවකාලික ආවරණයයි. මේ සඳහා භාවිතා කරන්නේ සුදු රෙදි කඩකි .
- එක් එක් සම්ප්‍රදායට අවේණික නාද මාලා හා තාල රූප අනුව ගායනා කරයි.
- කඩතුරා කවියක් ලියා ඇතිනම්

**යනාදි ඉහත කරුණු වලින් හතරක්වත් ලියා තිබේ නම්**

**ලකුණු - 04**

**iv. පංච තූර්ය වාදනය**

- **දේශීය වාද්‍යභාණ්ඩ වාදනය කරන ආකාරය අනුව වර්ග 5කට බෙදා දැක්වීම බව.**
- අතීයේදී ජය ශ්‍රී බෝධියට පවත්වනු ලබන උතුම් ශබ්ද පූජාවක් මහා වංශයේ බව සඳහන් වේ.
- ආතත,විතත.විතතාතත,ඝන,සුසිර යනුවෙන් භාණ්ඩ වාදනය කරන ආකාර අනුව කොටස් පහ ක් බව.
- ආගමික හා සමාජ උත්සව වලදී භාවිතා කරයි.

**ඉහත කරුණු හෝ ඊට අදාල කරුනු ඇතුලත් වී තිබේ නම්**

**ලකුණු - 04**

V. සතර අභිනය

- අභිනය සංස්කෘත භාෂාවේ එන වචනය ක් බව.
- ඉදිරියට ගෙන ඒම **අභිනය** ලෙස භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වේ.
- අභිනය සිව් වැදෑරුම් වේ.
- <u>ආංගික</u> - අංග ,ප්‍රත්‍යාංග, උපාංග,භාවිතයෙන් අදහස් ප්‍රකාශ කිරීම ආංගික අභිනය බව
  අභිනය දර්පණය හා නාට්‍ය ශාස්ත්‍රයේ තොරතුරු දැක්වෙන බව

  <u>වාචික</u> -නොයෙක් හැඟීම් ගෙන දීමට සමත් අර්ථයක් ගෙන දෙන්නා වූ පද්‍ය,ගීත,සංවාද මෙයට අයත් බව

  <u>සාත්වික</u> - 1.රංගනයක් ඉදිරිපත් කිරීමේදී නළුවකු විසින් ඉස්මතු කරගන්නා භාවයන් ඉදිරිපත් කිරීම සාත්වික අභිනයයි.

  2.මුහුණ හා විවිධ මාංශ පේශින්ගෙන් සමන් විතව ඉදිරිපත් කරන අදහස් ප්‍රකාශනය.

  3.වෙව්ලීම කඳුළු ගැලීම,දහදිය දැමීම යනාදී අවස්ථා සාත්වික අභිනයට අයත් වේ.

  <u>ආහාර්ය</u> -පිටතින් භාවිතයට ගන්නා සියළුම රංග වස්ත්‍ර භාවිතය,වෙස් ගැන්වීම,වේදිකා උපකරණ ,සැරසිලි උපයෝගී කරගනිමින් අදහස් ප්‍රකාශ කිරීම ආහාර්ය අභිනයට අයත් වේ

  නර්තනයක හෝ නාට්‍යයක වෙස් ගැන්වීම, අංග රචනය ,වෙස් මෝස්තර ද මෙයට ඇතුලත්ය.

**ඉහත කරුණු හෝ ඊට අදාල කරුනු ඇතුලත් වී තිබේ නම් ලකුණු 04**
**මාතෘකා වලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියා ඇත්නම්**
**මුළු ලකුණු ((4X 3) =12**

**4. දේශීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි ශාන්ති කර්ම තුළ සුවිශේෂී ලක්ෂණ හඳුනා ගත හැකිය.**

i. <u>ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු දෙකක් හඳුන්වන්න.</u>

- සශ්‍රීකත්වය සහ සෞභාග්‍ය සඳහා සිදු කරන බව.
- ලෙඩ රෝග සහ අපල උපද්‍රව වලින් මිදීම අපේක්ෂාවෙන් පවත්වන බව
- ස්වභාවික විපත් වලින් ආරක්ෂා වීමට පවත්වන බව
- ගමට රටට සෙතක් ශාන්තිය උදෙසා පැවැත් වෙන බව
- අධ්‍යාපන අරමුණු අපේකෂාවෙන් සහ සංරක්ෂන කටයුතු උසදසා පැවැත් වන බව

**ඉහත කරුණු හෝ ඊට අදාල කරුනු ඇතුලත් වී තිබේ නම්**

**ලකුණු - 04**

ii. **කොහොඹාකංකාරිය, දෙවොල්මඩුව සහ පහන්මඩුව යන ශාන්ති කර්මවල භාවිත ප්‍රධාන ඇඳුම් කට්ටල පිළිබඳව කෙටියෙන් පැහැදිළි කරන්න.**

- **උඩරට නර්තන සම්ප්‍රදායේ** ප්‍රධාන ශාන්ති කර්මය ලෙස හැඳින්වෙන්නේ කොහොඹා කංකාරි ශාන්ති කර්මයයි. .මෙම ශාන්ති කර්මයේ දී යක්දෙස්සන් විසින් අඳිනු ලබන සාම්ප්‍රදායික ඇඳුම් කට්ටලය **වෙස් ඇඳුම්** කට්ටලය නමින් හැඳින් වේ .මෙහි භාවිත වර්ණ ලෙස සුදු,රතු, රිදී වර්ණ මූලික වේ .රිදී වර්ණයෙන් දිස්වෙන වෙස් තට්ටුව හා වර්ණ සංකලණය සෞම්‍ය බවක් දර්ශණය වේ.

  වෙස් ඇඳුම් කට්ටලය කොටස් නම් කිරීම ( ජටාව ,ජටා පටිය,පාහින් පත,අවුල් හැරය,සිඛා බන්ධනය ආදිය) විස්තර කිරීම.

- **පහතරට නර්තන සම්ප්‍රදායට** අයත් දෙවොල් මඩුවෙහි ඇඳුම් කට්ටලය තෙල්මේ ඇඳුම් කට්ටලයයි.මෙහි වර්ණ භාවිතය සුවිශේෂී වේ. එනම් කැපී පෙනෙන වර්ණ වන කහ ,තැඹිලි ,රතු,කළු, සුදු පබළු වලින් ගෙත්තම් කර අලංකාර කර ඇත.

**තෙල්මේ ඇඳුම් කට්ටලයේ** පබළු හැට්ටය බෝරිච්චි අත් සහිතය.මුතු,පබළු ,කනඳු ආදියෙන් විවිධ මෝස්තර සහිතව වලින් අලංකාර කර ඇත.

සිලම්බු,රහු,ලණුව සේලය,පච්ච වඩම,ඉණ රැල්ල, පබළු ඉණ හැඩය,පබළු කරතැල්ල,අත් පටි,නළල් පටිය ආදිය පළඳින ස්ථාන පිළිබඳ අවබෝධය තිබීම.

- **සබරගමු සම්ප්‍රදායෙහි පබළු ඇඳුම් කට්ටලය**
  රතු ,සුදු වර්ණයන් මූලික කරගනිමින් නිර්මාණය වී ඇත. සබරගමු සමන් දේවියන්ගේ ඇඳුම් කට්ටටලයට සමාන වන ලෙසින් පබළු ඇඳුම් කට්ටලය සකස් වී ඇත.
  සුදු මේස් ,පබළු හැට්ටය,සේලය,රතු රෙද්ද,අත් පොට හතර,ඉණ වෙළුම් පටිය ,ඉණ හැඩය,හැඩ කැල්ල,කර පටිය යනාදි හඳුන්වා තිබීම.

**ඉහත කරුණු හෝ ඊට අදාල කරුනු ඇතුලත් වී තිබේ නම්**

**ලකුණු - 04**

iii. **දෙවොල් මඩුව ශාන්තිකර්මයෙහි කතා පුවත මඟින් සමාජයට ලබා දෙන යහපත් ආකල්ප විස්තර කරන්න.**

- සේරමාන් කතා පුවත පිලිබඳ ඇසුරින් කරුණු දැක්වීම.
- එහි ගෝණ දෙන වෛරයෙන් මිය යාම.රජු විසින් තවත් කෙනෙකුගේ ජීවිතයට හානි කිරීම ආදී ය නිසා .. එල විපාක ලැබෙන බව
- වෛරය, පලි ගැනීම, ක්‍රෝධය වැනි සිතුවිලි වලින් ඈත් වීම හේතුවෙන් සතුට විනෝදය තම ජීවිත වලට ලඟා කර ගත හැකිබව

**ඉහත කරුණු දෙකක් විස්තර කර තිබෙනම් ලකුණු - 04**

**<u>මුළු ලකුණු (4X 3) =12</u>**

(5) **ගැමි නැටුම් සහ ගැමි නාටක තුළින් විවිධ වූ ශ්‍රී ලාංකීය ජන ජීවන තොරතුරු හෙළිදරව් වේ.**

i. **සොකරි ගැමි නාටකයේ පැවැත්වීමේ අරමුණු දෙකක් ලියා එහි රඟමඩල කෙටියෙන් හඳුන්වන්න.**

**පැවැත්වීමේ අරමුණු:-**

- සශ්‍රිකත්වය සහ සෞභාග්‍ය මුල් කරගෙන සොකරි නාටකය පවත්වනු ලබ න බව
- පුජාර්ත්‍ය සඳහා ද පවත්වනු ලබ න බව
- වර්තමානයේදී සොකරි නාටකය අභාවයට යා නොදී සංරක්ෂණය සඳහා ද , අධ්‍යාපනික අරමුණු ඉටුකරගැනීම සඳහා ද රග දක්වයි

**සොකරි රඟමඩල**

- සොකරි රඟමඩල කමත ලෙස හඳුන්වයි .මෙය වෘත්තාකාර රඟමඩල ක් බව
- රඟමඩල මැද මුනින් අතට තැබූ වංගෙඩියක් මත තබන ලද ලන්තැරුමකි.
- සොකරි නාටකයේ චරිත වංගෙඩිය වටා රඟ දක්වනු ලබන බව
- සශ්‍රිකත්වය සංකේතවත් කිරීමට පසෙකින් අඹ ගෙඩි සහිත අත්තකි.
- එක් පසෙක මල්යහනක් ඇත.
- ආලෝකය ලබා ගැනීම සඳහා කොප්පරා වලින් දැල්වූ පහන් රංග භූමියේ වටා දල්වන බව
- බෙර වාදයකයින් සහ ගායකයින් පසෙකින් සිටිති . ප්‍රේක්ෂකයන් රංග භූමිය වටා සිට නරඹන බව

**ඉහත කරුණු හෝ ඊට අදාල කරුනු ඇතුලත් වී තිබේ නම්**
**ලකුණු - 04**

ii. **ගැමි නැටුම් හා බැඳි ගායනා තුළින් පිළිබිඹුවන සමාජ සහජීවනය පිළිබඳ ව නිදසුන් සහිතව පැහැදිළි කරන්න.**

- එදා ගැමි සමාජය කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කල අයුරු ගායනා වලින් පිලිහිබු වන බව

  උදා : "අක්කන්ඩියේ යමු අපි පන් නෙලන්නට

  සතුරු වෙලා නොව දෙපිල සැදෙන්නේ "

- එකිනෙක අතර සංවේදී කම ගොඩනැගී තිබුණු බව

  උදා :"අනුන්ගේ පන් කොළ එක් නොකරන්නේ

  එපා කියන තැන තැන නොසිටිල්ලා

- වැඩිහිටියන්ට සැලකීම

  උදා :ගුරුන් අතර දී ලී බෙදවාගෙන

- අගය කලයුත්තන් ඇගයීම

  උදා :"වරලස නිල් පැහැයෙන්ද "

මෙම කව්වලින් සමාජ සම්බන්ධතා පවත්වා ගැනීම සිදු වූ අයුරු විවිධ කවි ගායනා වලින් මතු කර දක්වයි. ඒ සඳහා අනන්‍ය වූ නාද මාලා ද නිර්මාණය වී ඇති අයුරු උදාහරණ සහිතව දක්වා තිබීම

**ඉහත කරුණු හෝ ඊට අදාල කරුනු ඇතුලත් වී තිබේ නම්**

**ලකුණු - 04**

iii. **ගැමි නැටුම්වල දීර්ඝ ඉතිහාසයක් ඇති බව ඔබ උගත් රූකමක් හෝ දේශාටන වාර්තාවක් ඇසුරින් සනාථ කරන්න.**

- ගම්පල යුගයට අයත් ඇම්බැක්කේ දේවාලයේ ලී බාල්කයක ලී කෙලි නැටුමක රූකමක් දක්නට ලැබේ.දෙදෙනා බැගින් සැදී ලී කෙලි නර්තනයක යෙදෙන ආකාරය ඉන් පිලිබිබු වේ.ගැමි නැටුමට දීර්ඝ ඉතිහාසයක් ඇති බව

- මහනුවර යුගයේ දෙවන රාජසිංග රජුගේ කාලයේ ලංකාවට පැමිණ සිරකරුවෙකු ලෙස ජීවත් වූ රොබට් නොක්ස් විසින් රචිත "එදා හෙළදිව " කෘතියේ දළදා පෙරහැර ගැන විස්තර දක්වා ඇත.

  "දේවාල විහාරවල තේවාව සඳහා නියම වූ කුල වලින් පැමිණ කලගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනෝ වෙත් " යනුවෙන් සඳහන් වේ .

- කලගෙඩි නැටුම අතීතයේ සිට පැවත එන කාන්තාවන් සඳහා සුවිශේෂ වූ ගැමි නැටුමක් බව .
- ගැමි නැටුම්ද පාරම්පරික කුල ක්‍රමය මත පදනම්ව තිබූ බව.

**ඉහත කරුණු හෝ ඊට අදාල කරුනු ඇතුලත් වී තිබේ නම්**

**ලකුණු - 04**

**මුළු ලකුණු (4X 3) =12**

6. පහත දැක්වෙන රූප රාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

|  |  |  |
|---|---|---|
| **A** | **B** | **C** |

i. මෝගල් රාජ සමයේ සංවර්ධනය වූ නර්තන සම්ප්‍රදාය ඉහත ඡායාරූප තුළින් තෝරා නම් කර, එහි සංගීතය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

- **කථක් නර්තන සම්ප්‍රදාය** නම් කිරීම.
- සංගීතය සඳහා උත්තර භාරතීය රාගධාරී සංගීතය භාවිතා කරන බව (හින්දුස්ථානී )
- ප්‍රධාන අවනද්ධ භාණ්ඩය ලියා තිබීම( පක්වාජ්/තබ්ලාව)
- ස්වර වාද්‍ය භාණ්ඩ නම් කර තිබීම (සර්පිනාව,හාර්මෝනියම්,සිතාරය,සාරංගිය,වයලීනය,බටනලාව)
- විවිධ මාත්‍රා මත නිර්මාණය වූ තාල මත නර්තනය කරන බව ලිවීම.
- උත්තර භාරතීය රාගධාරී සංගීතයේ ප්‍රධාන තාලයක් ලෙස “ත්‍රී තාල්" භාවිතා කිරීම.

**නර්තන සම්ප්‍රදාය නම් කිරීමට ලකුණු - 01**
**ඉහත කරුණු 03 ක් කෙටියෙන් විස්තර කිරීම - ලකුණු - 03**
**මුළු ලකුණු - 04**

**ii. A ඡායාරූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර, එහි ඉණට, ගෙලට හා නළලට පළඳිනු ලබන ආභරණ කොටස් තුනක් හඳුන්වන්න.**

- **භරත නාට්‍යම්**

**ඉණට - ඔට්ටියානම්**

ඉන කොටස අලංකාර කිරීම සඳහා රන් පැහැති ආභරණයකි .

ගෙලට - අට්ටියල් ,කාසි මාලෙයි,පදක්කම් මාලෙයි,මුත්තු මාලෙයි ,( රන් පැහැය මූලිකව සුදු ,රතු,සහ කොළ පැහැති විදුරු ගල් වලින් අලංකාර කොට පබළු මුසුව නිර්මාණය කර පළඳී.

නළලට - නෙත්ති පට්ටම් නළල මත පළඳී.(පබළු මිශ්‍රව අලංකාර ලෙස නිර්මාණය කර ඇත)

- රූපසටහන් මඟින් හැඳින්වීම

.

**නර්තන සම්ප්‍රදාය නම් කර තිබීමට ලකුණු - 01**
**ඉහත කරුණු තුනක් ලියා ඇත් නම් ලකුණු - 03**

iii. ඊශානදිග භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය ඇතුළත් රූපය තෝරා එම සම්ප්‍රදාය හා බැඳි ආගමික පසුබිම විස්තර කරන්න.

- මණිපුරි නර්තන සම්ප්‍රදාය නම් කර තිබීම
- ජන ජීවිතය හා බැඳි විවධ ජන කතා දේව කතා (විෂ්ණු,ක්‍රිෂ්ණ වැනි දෙවි වරුන් සම්බන්ධ) ඇසුරු කර ගනිමින් නර්තන සම්ප්‍රදායේ ආරම්භය සිදු වූ බව.
- මණිපුරි දේශය හා බිහිවීම සම්බන්ද කතා පුවත් (ශිව පාර්වතී,රාධ ක්‍රිෂ්ණ ආදිය)
- නර්තනාංග බිහිවීම සම්බන්ධ කතා පුවත් (රාශ් ලීලා, ලායි හරෝබා ආදිය)
- ආගමික ස්ථානයක් මුල් කර ගනිමින් නර්තනය ඉදිරිපත් කිරීම.

**නර්තන සම්පුදාය නම් කර තිබීමට ලකුණු - 01**
**ඉහත කරුණු තුනක් ලියා ඇත් නම් ලකුණු - 03**

**මුළු ලකුණු - 04**

**7). 21 වන සියවස වන විට සාම්ප්‍රදායික නර්තන කලාවේ නව ප්‍රවණතා දැකගත හැකිය.**

**i. රංග වස්ත්‍ර නිර්මාණකරණය**

- ශාන්ති කර්මයන්හි අනතර්ගත නර්තන අංග ප්‍රසංග වේදිකාවට පැමිණීම නිසා රංග වස්ත්‍රාභරණ විවිධාංගීකරණයට හා ප්‍රාසාංගිකත්වයට නැඹුරුවී ඇති බව
- නූතන ප්‍රසංග වේදිකාවේ රංගා ආලෝකය මඟින් රංග වස්ත්‍රාභරණවල හා ආකර්ශණීය ලෙස බව
- සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණවල වර්ණය වෙනස් වීම

. උදා - වෙස් ඇඳුම් කට්ටලයේ රෙදි විවිධ වර්ණ යොදා ගැනීම (කහ ,නිල්)
බෙර ඇඳුම් කට්ටලයේ විවධ වර්ණ යොදා ගැනීම.
තෙල්මෙ රංග වස්ත්‍ර නිර්මාණ කරණයේදී නවතම ක්‍රම භාවිත කිරීම.

- රංග වස්ත්‍ර නිර්මාණයේදී යොදාගත් අමුද්‍රව්‍ය වලට අමතරව නවතම අමු ද්‍රව්‍ය භාවිතය (රබර් සීට් ,වීදුරු ගල්,පබළු ,බ්‍රේඩින් යනාදිය)
- වේදිකාව තුළ ක්ෂණිකව ඇඳුම් මාරු කිරීමේ ක්‍රම සකස් වී ඇති බව
- ආකර්ශණීය බව වැඩි ආභරණ යොදා ගැනීම.
- ආකර්ශණය සඳහා විවිධ ශීර්ෂාභරණ පැළඳීම.
- විවිධරෙදි වර්ග යොදාගන නිර්මාණාත්මක ඇඳුම් කට්ටල නිර්මාණ ය වී ඇති බව.(සෙටින්,ඕගන්දි,නෙට්,වෙල්වට් ආදී රෙදි)

**ඉහත කරුණුවලින් දෙකක්වත් විස්තර කර තිබීම- ලකුණු - 04**

**ii. සමාජයීය අවශ්‍යතාවයන්ට අනුව නර්තනය යොදා ගැනීම.**

- විවාහ මංගල අවස්ථාවල නර්තනය යොදා ගැනීම .(මනාල යුවළ පිළි ගැනීම සහ වින්දන අවස්ථා සඳහා නර්තනය භාවිත ය.)
- දේශපාලන රැස්වීම් උත්සව සඳහා නර්තනය යොදා ගැනීම
- උපන් දින ,ප්‍රිය සම්භාෂණ අවස්ථා සඳහා යොදා ගැනීම.
- විදේශ නිලධාරීන් ,රාජ්‍ය නායකයන් පිළි ගැනීම සහ සංස්කෘතික උත්සව සඳහා යොදා ගැනීම.
- නර්තන ප්‍රසංග නිර්මානයේදී විවිධ රස වින්දනයෙන් යුතු ප්‍රේක්ෂකයන් සඳහා විවිධාංගීකරණ යෙන් යුතු නර්තන නිර්මාණ දක්නට ඇති බව.

- විවිධ ආයතන මට්ටමින් සහ රූපවාහිණී නාලිකා මගින් පවත්වන තරඟ අවස්ථා සඳහා නර්තන නිර්මාණය කිරීම.
- නර්තන පාඩම් සකස් කිරීම අන්තර්ජාලයට මුදා හැරීම සිදුවන බව.
- You tube"whatsapp"website "දැනුම බෙදා ගැනීම.

**ඉහත කරුණු වලින් දෙකක්වත් විස්තර කර තිබීම**

**ලකුණු -04**

**iii. "ප්‍රාසාංගික බව වර්ධනය කිරීමට තාක්ෂණය භාවිතය" යන ශීර්ෂ ඔස්සේ ඉහත ප්‍රකාශය සනාත කරන්න.**

- සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කිරමේ දී සජීවීව වාදනය හා ගායනය යොදා ගැනීම වෙනවට සංයුක්ත තැටි ,හඩ පට වැනි ක්‍රම ඔස්සේ පටිගත කල ගායන වාදන යොදා ගැනීම.
- නර්තන සම්ප්‍රදායන් මිශ්‍ර කර සකස් කරන ලද සංගීත කණ්ඩ භාවිතය (music track)
- ස්වභාවිකවම හඬින් ශබ්ද නගා ගායනා කිරීම වෙනුවට ශබ්ද විකාශණ යන්ත්‍ර මගින් හා ශබ්ද පරිපාලන උපකරණ,(fm mick) භාවිත කිරීම.
- සම්ප්‍රදායික රංග භූමියේ භාවිත කළ පන්දම් ආලෝක වෙනුවට ප්‍රාසාංගික බව වැඩි කර ගැනීම සඳහා තාක්ෂණයෙන් උසස් විදුලි ආලෝක ශිල්ප ක්‍රම යොදා ඇති බව
- ප්‍රාසාංගික බව වැඩිකර ගැනීම සඳහා සාම්ප්‍රදායික නර්තනයන්ට ගැලපෙන පසුබිම් දර්ශණ සඳහා පරිසනක තිර මඟින්,(projecter) භාවිතා කරන බව.
- වේදිකාව ඉහළට එසවීම.ඉහළ කොටස් පහළට ගෙන ඒම සඳහා ශිල්ප ක්‍රම භාවිත වන බව

.

**කරුණු දෙකක්වත් විස්තර කර තිබීම - ලකුණු -04**

**ඉහත ප්‍රශ්න කොටස් තුනට පිළිතුරු සපයා තිබේ නම් ලකුණු මුළු ලකුණු ((4X 3) =12**

******